දොඩම්ගොඩ ප්‍රාදේශිය සභාව
කළුතර දිස්ත්‍රික්කය
--------------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින හා සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2018 ඔක්තෝබර් 08 දින ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ඔක්තෝබර් 26 දින සභාපතිවරයාට යවා ඇත.

1:2 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර , මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට දොඩම්ගොඩ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

ස්ථාවර වත්කම් ගිණුමේ ශේෂය හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය සමාන විය යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ එම ගිණුම් දෙක අතර රු.3,028,092 ක වෙනසක් පැවතුණි.

1.3.2 **නොසැසඳුණු ගිණුම්**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.2,156,052 ක් වූ ගිණුම් විෂයයකට අදාළ ශේෂය හා ඊට අදාළ උපලේඛනයේ දැක්වෙන ශේෂය අතර රු.550,187 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 **ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

(අ) ලැබිය යුතු ගිණුම්

දීර්ඝ කාලයක සිට පැවත එන වීථි පහන් නඩත්තු වෙනුවෙන් ලැබිය යුතු රු.1,545,121 ක මුදල අයකර ගෙන නොතිබුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

දීර්ඝ කාලයක සිට පැවත එන රු.285,974 ක් වූ එකතු කළ අගය මත බදු (vat) මුදල සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවීමට කටයුතු කර නොතිබුණි.

1.3.4 **විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම**

උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා රු.599,874 ක් වූ කර්මාන්ත ණයගැති ශේෂය විගණනයේදී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 <u>නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්</u>

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ<br>(i) 134(1) වගන්තිය | --- | දියුණුකළ ප්‍රදේශ වශයෙන් ප්‍රාදේශීය සභාව විසින් ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ ඇතුළත පිහිටියා වූ යම් නිශ්චල දේපළක් හෝ නිශ්චල දේපළ සම්බන්ධයෙන් වාර්ෂික වටිනාකම මත වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) 143 (1) වගන්තිය | --- | අමාත්‍යවරයාගේ අනුමැතියට යටත්ව සභාව විසින් වරිපනම් බදු සඳහා නව හඳුනාගැනීමක් සිදු කර නොතිබුණි. |
| (ආ) 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | 42,816,076 | සභාව සතු සියළු ඉඩම්, ගොඩනැගිලි සෑම වර්ෂයකටම වරක් පරීක්ෂා කර නොතිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි<br>(i) මුදල්රෙගුලාසි 371(2)(ඇ) | 88,103 | දෙන ලද අත්තිකාරම් අදාළ කාර්යය නිම වූ විගසම පියවිය යුතු වුවත් දීර්ඝ කාලයක සිට පැවත එන රු.88,103 ක් වටිනා අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 1647(ආ) | --- | සභාව සතුව පවතින වාහන හා ඒවායේ උපකරණ පිළිබඳ සම්පූර්ණ සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | --- | පරිගණක උපාංග හා මෘදුකාංග සම්බන්ධයෙන් වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඉ) 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | --- | වරිපනම් වලට යටත් වන , දේපළ වසර 05 කට වරක් තක්සේරු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

## 2. <u>මූල්‍ය සමාලෝචනය</u>

### 2:1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.2,669,511 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.6,859,798 ක් විය.

### 2.2 <u>ආදායම් පරිපාලනය</u>

#### 2:2:1 <u>ඇස්තමේන්තුගත ආදායම් , බිල් කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්</u>

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2017 | | | | 2016 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර්31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තු ගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) වරිපනම් හා බදු | 6,045,660 | 3,666,322 | 5,139,522 | 2,157,052 | 5,031,550 | 3,775,832 | 7,612,794 | 3,632,713 |
| (ii) කුලී | 1,975,870 | 650,507 | 739,171 | 32,500 | 2,587,875 | 634,725 | 1,527,425 | 99,726 |
| (iii) බලපත්‍ර ගාස්තු | 391,500 | 122,000 | 121,000 | 1,000 | 324,000 | 185,650 | 501,265 | - |
| (iv) වෙනත් ආදායම් | 21,525,000 | 5,000,000 | 3,909,717 | 13,596,585 | 22,770,500 | 17,000,000 | 24,954,985 | 12,506,302 |

#### 2.2.2 <u>ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය</u>

සමාලෝචිත වර්ෂය ආරම්භයට සභාවේ සමස්ථ හිඟ ආදායම රු.16,238,741 ක් වූ අතර වර්ෂය තුළ බිල් කිරීම් රු.9,438,829 ක් විය. වර්ෂය තුළ ලැබීම්, කපාහැරීම් හා ගැලපුම් රු.9,890,433 ක් වූ අතර සමස්ථ ආදායම් හිඟය රු.15,787,137 ක් විය.

#### 2.2.3 <u>වරිපනම් හා බදු</u>

<u>වරිපනම්</u>

i. සමාලෝචිත වර්ෂය ආරම්භයට රු.3,568,371 ක වරිපනම් බදු හිඟයක් පැවති අතර වර්ෂය තුළදී හිඟයෙන් රු.2,388,368 ක් හෙවත් සියයට 67 ක් පමණක් අයකරගෙන තිබුණි.

ii. සමාලෝචිත වර්ෂය සඳහා වරිපනම් බිල් කිරීම රු.2,227,722 ක් වූ අතර වර්ෂය තුළදී ඉන් රු.1,810,450 ක් හෙවත් සියයට 81 ක් පමණක් අයකරගෙන තිබුණි.

#### 2.2.4 <u>වෙනත් ආදායම්</u>

(අ) <u>දැන්වීම් පුවරු ආදායම්</u>

1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනත පරිදි කිසියම් දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමේදී සභාවේ ලේකම් විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක

බලය යටතේ පමණක් ප්‍රදර්ශනය කළ යුතු වුවත් එසේ බලය ලබා නොගෙන දැන්වීම් පුවරු ප්‍රදර්ශනය කර තිබුණි. එසේ ප්‍රදර්ශනය කර තිබූ දැන්වීම් පුවරු හා නාම පුවරුවලින් අයවිය යුතු රු.276,112 ක් අය කර ගෙන නොතිබුණි.

(ආ) <u>රථවාහන නවතා තැබීමේ ගාස්තු</u>

සභා බල ප්‍රදේශයේ ත්‍රීරෝද රථ නවතාතැබීමේ ස්ථානවල නවතා තබන ත්‍රීරෝද රථ වලින් ගාස්තු අයකර ගැනීම සඳහා අතුරු ව්‍යවස්ථා පනවා ගෙන ගාස්තු අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.2.5 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.18,379,490 ක් හා මුද්දර ගාස්තු රු.13,596,585 ක් විය.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3:1 <u>කාර්ය සාධනය</u>

ප්‍රාදේශිය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය , පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරිම , ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරිම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) <u>ක්‍රියාකාරී සැලැස්ම</u>

සභාව විසින් 2017 වර්ෂය වෙනුවෙන් ක්‍රියාත්මක කරනු ලබන කර්මාන්ත පිළිබඳ විස්තර ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කරමින් ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර අනුමත කර ගෙන නොතිබුණි.

(ආ) <u>ඝන අපද්‍රව්‍ය කළමනාකරණය</u>

(i) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය සඳහා රු.8,039,060 ක වියදමක් දරා තිබූ අතර දිරන කසළ සඳහා කොම්පෝස්ට් ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කර නොතිබුණි. මුළු සභා බල ප්‍රදේශයම ආවරණය වන පරිදි කසළ එකතු කිරීම සිදු නොකරන අතර කසළ බදු පැනවීමක් ද සිදු කර නොතිබුණි.

(ii) සභාව විසින් කසළ කළමනාකරණ කටයුතු නිසි ලෙස ක්‍රියාත්මක කිරීමට නිසි හා ප්‍රමාණවත් සැලැස්මක් පිළියෙල කර නොතිබූ අතර ඒ සම්බන්ධව අතුරු ව්‍යවස්ථාවක්ද පනවා ගෙන නොතිබුණි.

(ඇ) <u>තිරසර සංවර්ධන ඉලක්ක</u>

තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් සභාව දැනුවත්වී නොතිබුණි.

3:2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

<u>පරිසර බලපත්‍ර නිකුත් කිරීම</u>

(අ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන ගැසට් නිවේදනයෙන් ප්‍රකාශයට පත් කරන ලද මධ්‍යම පරිසර අධිකාරිය මගින් පළාත් පාලන ආයතනවලට බලතල පවරා දීම හා බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳ උපදෙස් මාලාවේ පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කිරීමේ ක්‍රියා පරිපාටිය ප්‍රකාරව සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර නිකුත් කළ යුතු වුවත් , 2017 වසරේ පවත්වාගෙන ගොස් තිබූ බොහෝ කර්මාන්ත වෙනුවෙන් පරිසර ආරක්ෂණ බලපත්‍රයක් නිකුත් කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 2017 වසරට අදාළව නිකුත් කර තිබුණේ පරිසර බලපත්‍ර තුනක් පමණි.පරිසර බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත හඳුනාගැනීමට හෝ ඇගයීමට හෝ අදාළව නිවැරදි සමීක්ෂණයක් සභාව විසින් සිදු කර නොතිබුණි.

3:3 මානව සම්පත් කළමනාකරණය

(අ) සේවක පුරප්පාඩු

2017 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කරන ලද කාර්යය මණ්ඩල විස්තරය අනුව සභාවේ තාක්ෂණ නිලධාරි තනතුරක , පෙර පාසැල් ගුරු තනතුරක , යන්ත්‍ර ක්‍රියාකරු තනතුරක හා ක්ෂේත්‍ර කම්කරු තනතුරු දෙකක පුරප්පාඩු පැවතුණි.

(ආ) සේවක ණය

විශ්‍රාම ගොස් සිටින සේවකයකුගෙන් අයවිය යුතු ණය ශේෂය රු.4,552 ක් විය.

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

(අ) දේපළ බදු දීම

(i) සභාව සතුව දොඩන්ගොඩ ,සපුගහවත්ත නැබඩ කඩ කාමර 62 ක් පැවති අතර මෙම කඩ කාමර වෙනුවෙන් නව තක්සේරුවක් සිදු කර කඩකුලී ආදායම ඉහළ නංවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ii) දොඩන්ගොඩ පොදු වෙළඳපොලේ කඩ කාමරවලට අදාළව තිබූ සියළුම ගිවිසුම් කල් ඉකුත් වී තිබූ අතර එම ගිවිසුම් අළුත් කිරීම වෙනුවට පැවති පැරණි ගිවිසුම්වල බදු කාල සීමාව හා සභාව වෙනුවෙන් බදු ගිවිසුම අත්සන් කරනු ලබන පුද්ගලයාගේ නම ව්‍යාජ ලෙස වෙනස් කර සකස් කර තිබුණි.

(ආ) ඉන්වෙන්ට්‍රි ලේඛනය

ඉන්වෙන්ට්‍රි ලේඛනය කිසිදු අධීක්ෂණයකින් තොරව පවත්වාගෙන ගොස් තිබූ අතර සෑම වර්ෂයකම වර්ෂය අවසාන දිනට ලේඛනය තුලනය කරමින් ශේෂය ඉදිරියට ගෙන ගොස් නොතිබුණි. තවද සභාව සතු දැනට පවතින වත්කම් හා ලේඛනගත වත්කම් අතර නොගැලපෙන තත්ත්වයන් නිරීක්ෂණය විය.

3:5 වත්කම් කළමනාකරණය

3.5.1 **පවරා නොගත් වත්කම්**

ඇස්තමේන්තුගත මුදල රු.600,000 කින් ඇබිලව්වත්ත ජනපදයේ පුද්ගලික ඉඩමක පර්චස් 02 ක ඉදිකර තිබූ පොදු ළිඳට අදාළ භූමිය පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.

3.5.2 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය

(අ) සමීක්ෂණ වාර්තාව අනුව බෝම්බුවල පුස්තකාලයේ තිබී අස්ථානගත වී තිබූ රු.22,771 ක් වටිනා පොත් 220 ක් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) 2017 වසරේ සිදු කරනු ලැබූ භාණ්ඩ සමීක්ෂණයේ නිර්දේශ 2018 මැයි 25 දින වන විටත් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) තෙබුවන , නැබඩ , බෝම්බුවල , ගමගොඩ , සෝභිතගම හා අධිකාරිගොඩ සභා පුස්තකාල විසින් ඉන්වෙන්ට්‍රි ලේඛන යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඈ) පැරණි සභා ගොඩනැගිලි භූමියේ තිබූ සියළුම භාණ්ඩ සමීක්ෂණය කර තිබූ නමුත් බොහොමයක් භාණ්ඩ කිසිදු ගබඩා ලෙජරයක හෝ ඉන්වෙන්ට්‍රියක සටහන් කිරීමට කටයුතු කර නොතිබුණි.

4. **<u>ගිණුම් කටයුතුභාවය හා යහපාලනය</u>**

4.1 **<u>අයවැය පාලනය</u>**

සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ගත හා තථ්‍ය ආදායම් වල සියයට 20 සිට සියයට 72 දක්වාත් , වියදම්වල සියයට 19 සිට සියයට 98 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූ හෙයින් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

5. **<u>පද්ධති හා පාලන</u>**

විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| <u>පද්ධතිය</u> | | <u>අඩුපාඩුව</u> |
|---|---|---|
| (අ) ආදායම් පාලනය | i | හිඟ ආදායම් අය නොවීම |
| | ii | හිඟ ආදායම් වාර්තා / ලේඛන යාවත්කාලීන නොකිරීම |
| (ආ)සේවක කළමනාකරණය | i | මාර්ග හා ක්ෂේත්‍ර කම්කරුවන් නිවැරදි ක්‍රමවේදයක් යටතේ සේවයේ නොයෙදවීම |
| | ii | සේවක අධීක්ෂණය දුර්වල මට්ටමක පැවතීම |
| (ඇ) අයවැය පාලනය | i | අයවැය හා තථ්‍ය වියදම් අතර විශාල විචලනයන් පැවතීම |
| | ii | ආදායම් ඇස්තමේන්තු තාත්වික නොවීම |